# 12 කුරහන් ඉසිමුව කළුවර බලාලා

## ජන කවි (කුරක්කන් කවි)

ජන කවි පිළිබඳව තොරතුරු රාශියක් තුන්වන පාඩමේ දී දැක්විණි. කුරක්කන් කවි ද, ජන කවි ප්‍රවර්ගයකි. ගොවියාට කුරක්කන් වගාවේ දී ඇති වන දුෂ්කරතා කුරක්කන් කවි මඟින් ප්‍රකාශ වේ. කුරක්කන් හේන අස්සැද්දීමට පෙර කැලෑ එළි-පෙහෙළි කිරීමේ පටන්, අස්වැන්න නෙළා ගැනීම දක්වා වූ සියලු අවස්ථා කුරක්කන් කවි තුළ අන්තර්ගත වේ. ඉතා වෙහෙස වී කුරක්කන් හේන සකසන ආකාරය ද වගාව සරුවනවාත් සමඟ එයට හානි කිරීමට සතුන්ගේ පැමිණීම ද එය ආරක්ෂා කිරීමට තමා දැරූ වෙහෙස ද පිළිබඳව ගොවියාට පහළ වූ සිතුවිලි නිරායාසයෙන් කවි බවට පත් වී ඇත.

මෙම පාඩමේ ඇතුළත් වන්නේ එබඳු කුරක්කන් කවි කිහිපයකි.

දුරුතු මහේ දී කැලයට වැදීලා
මසක් පමණ කල් කැලවල් කොටාලා
මැදින් දිනේ දී වල් ගිනි තබාලා
කුරහන් ඉසිමුව කළුවර බලාලා

එල්ල වෙන්ට කවි කර කීවෙමි බොහොම
කොල්ල කන්ට එති සිවුපාවෝ බොහොම
ගොල්ල සමඟ එති ඌරෝ සැමදාම
තිල්ල අඹති සත් දවසින් බැලුවාම

මා කී දේ දෙයියනි බොරුවක් ම නැති
බිම එළි වුණොත් කණු මදු බොහොම ළඟ ඇති
ඇහැට වෙහෙස ඇත තුන් යමට නිදි නැති
ගොබ කළු වෙමින් කුරහන් කිරි වැද වැඩෙති

හේනේ පැලේ මා විදිනා සුරුක්කන්
ඌරෝ ඇවිත් වට පිට කරති සක්මන්
වැටටත් උඩින් උන් අල්ලන මලක්කන්
අපොයි මගේ කිරි වදිනා කුරක්කන්


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කටු ඇල්ලේ මගෙ හේනේ කුරක්කන්
වැට අහුරා උෟරන්ගෙන් වළක්කන්
කර ගන්නට බැරි උන් මහ කුරක්කන්
උෟරෙනි නොකා පලයව් මගෙ කුරක්කන්

මෙදා හේනෙ පැහිලා ඇති කුරක්කන්
රන්වන් කරල් බර වී ඇති සුරක්කන්
උෟරෝ නොකෑවොත් හේනේ කුරක්කන්
බඩගින්නට අවුසදයකි කුරක්කන්

කුරක්කන් තුනයි වැපුරුවෙ අමාරුවේ
කපන්ටත් බැරුව අතපය රුදාවේ
අරින්ටත් බැරුව ලොවග ම සිනාවේ
කපමු නෑනෙ ඉපනැල්ලේ සුබාවේ

එපෙති දෙපෙති මහ හේනේ කුරක්කන්
මගෙ යන්නෝ මට සරදම් කරක්කන්
එපෙති වෙන්ඩ කවුදැයි කළ නරක්කන්
කපා ගනිමු එක පෙත්තේ කුරක්කන්

## අභ්‍යාස

01. කුරක්කන් වගාවේ දී ගොවියා මුහුණ දුන් විවිධ අභියෝග ජය ගැනීමට ඔහු දැරූ වෙහෙස කුරහන් කවි මඟින් ප්‍රකාශ වන අන්දම පැහැදිලි කරන්න.

02. ජන කවියේ ඇති අව්‍යාජත්වය කුරක්කන් කවි කෙරෙන් නිරූපණය වන ආකාරය උදාහරණ සහිත ව විමසන්න.

03. සරලත්වය, සංක්ෂිප්ත භාවය හා ධ්වනිතාර්ථවත් පද භාවිතය ද කුරක්කන් කවි සාර්ථක වීමට හේතුවකි. නිදසුන් සහිත ව සාකච්ඡා කරන්න.